"අපේ විත්ති" සහ "ප්‍රඥා ප්‍රදීප"



නොයෙක් රටවලට සංක්‍රමණය වූ අපේ ප්‍රජාව ඒ ඒ රටවල කරගෙන යන්නා වූ දේ පිළිබඳව ලොව සතර දිගින් අසන්නට, දකින්නට ලැබෙයි. ඒ අතරින් මෙල්බන් නුවර වාසී අපේ ඇත්තන්ගේ කටයුතු මුලට එන්නේ ලොව වැඩිම පිරිසක් ඒකරාශී වී සිටින්නේ මෙහි වන නිසායි. වැඩිහිටියන් වශයෙන් අප කරන කියන අපේ දේවලටත් වඩා වැදගත් වෙන්නේ අපගේ දූ දරුවන්ට අපි ලබා දෙන දේයි. පසු ගිය මාසයේ පැවැත්වීමට යෙදුන සිංහල භාෂා පාසල් දෙකක වාර්ෂික විවිධ ප්‍රසංග වලට සහභාගී වීමට අප හට ද අවස්ථාව ලැබිණ. බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසල් දෙකක වාර්ෂික විවිධ ප්‍රසංගවලට සහභාගී වීමට අප හට ද අවස්ථාව ලැබිණ. බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසලේ "අපේ විත්ති" සහ වික්ටෝරියානු භාෂා පාසලේ නෝබල් පාක් හි භාවනා මධ්‍යස්ථානයේ "ප්‍රඥා ප්‍රදීප" වාර්ෂික විවිධ ප්‍රසංගයි, ඒ. ඒ පිළිබඳව සටහන් තැබීම අපගේ යුතුකමක් මෙන්ම වගකීමක්ද වෙයි.

මුලින් ම පැවැත්වූයේ "අපේ විත්ති" ප්‍රසංගයයි. දරුවන්ගේ හේරී හා සක් වාදන මධ්‍යයේ ආරාධිත අමුත්තන් පෙරහැරකින් කැඳවාගෙන යන ලදී. ඔවුන්ව පිළිගන්නා ලද්දේ සිංහල ජාතික ඇඳුමින් හා ඔසරියෙන් සැරසුනු තරුණ දරු දැරියන් විසිනි. ඒ බුලත් හුරුළු දීමෙනි. චිරාත්ගත සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව පාසල් ගීය ගැයීමට යෙදිණ. සභාපති අශෝක වීරරත්න මහත්මාගේ පිළිගැනීමේ කතාවෙන් අනතුරුව, ගරු ස්වාමීන් වහන්සේගේ අනුශාසනාවෙන්, ආරාධිතයින්ගේ කතාවන් පැවැත්විණ.

සුපුරුදු පරිදි, පළමුවන වසරේ සිසුවියන් විසින් පූජා නැටුම ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා පිළියෙල කරගත් ඇඳුම ඊට හොඳින් ගැලපිණ. බාලාංශ පන්තියේ "සුන්දරයි උදේ" අංගයෙන් පසුව පස්වන වසරේ "හැංගී හැංගී" ගීතය සඳහා නැටුමක් ඉදිරිපත් විණි. අනතුරුව දෙවන වසරේ සිසුන් ඉදිරිපත් කළ "අපි හොඳ ළමයි වෙමු" අංගය පෙළ ගැන්විණ. පෙර පටිගත කරගත් හැඩට අනුව වුවද නියමිත වෙලාවට දෙබස් කට පාඩමින් මිමිණීම ලේසි පහසු නොවේ. දරුවෝ මේ අභියෝගයට නිරතුරුවම මුහුණ දෙති.

"රයිගමයයි ගම්පලයයි", අපේ ගමට අමතක නොකරන දේවල්, "ගමට නම හැදුන හැටි", "පාන්දරින් ඉස්කෝලෙට" වැනි අංග ඉන් අනතුරුව ඉදිරිපත් විණ. "ගමට නම හැදුන හැටි" අංගයේ දන්නෝ බුදුන්ගේ ගීතය ද ගායනා විය. "පාන්දරින් ඉස්කෝලෙට" අංගය සඳහා කරත්තයක් අපූරුවට නිර්මාන්‍ය වී තිබිණ. "කුරුළු ගමේ" ගීතයට කළ රඟපෑම් හා නර්තන සඳහා නිර්මාණය කළ හිස් වැසුම් සිත් ගන්නා සුළු විය. වර්ණවත් ඇඳුම් හැඳ පැළැඳ අංග ඉදිරිපත් කිරීම සඳහා හොඳ ගීත තෝරා ගැනීම වෙසෙසින් අගයකළ යුතුව ඇත.

ලයනල් රන්වලයන් හා රොඩ්නි වර්ණකුළ ගැයූ "ගමේ ගොඩේ" ගීතයට කළ ඉදිරිපත් කිරීම ද අගනේය. "සීතාරම්බර පට සළු" කෙටි නාට්‍යය ද අගේ කළ යුතු වන අතර රඟපෑමට දක්ෂ දරුවන් කීප දෙනෙකුගේ ම හැකියාවන් කැපී පෙනිණ.

මෙල්බන් හි වේදිකා ගතවුන "ගම අවුලඥේඥං" ප්‍රසංගය සඳහා බ්‍රන්ස්වික් සිංහල භාෂා පාසලේ දරු දැරියන් ඉදිරිපත් කළ "ලොකු වුණාම කවුද වෙන්නෙ? " ගීතයේ රඟපෑමද දරුවන්ගේ රංගන කුසලතා ඉස්මතු කළ අගංයක් විය. එය පුහුණු කළ ගුරුතුමියම එහි ගුරුවරියගේ චරිතයට පණ පෙවීම ද විශේෂයකි. "දෑතේ බංගලි වලලු" ගීතයට හා ධීවර ගීතයට කළ ඉදිරිපත් කිරීම් ඉතා සිත් ගන්නා සුළු විය. "වඳුරු නුවණ" අංගය සමග "අඹ දඹ නාරං" ගීතයක් ඉන් අනතුරුව "බොරු කකුල් කාරයාගේ ඉදිරිපත් කිරීමට ප්‍රෙඩි සිල්වා මහත්මයා ගැයූ "අමුතු ඇඳුම්" ගීතයත් ගැලපෙන සේ යොදා ගැණින. "පොල් ගස මුදුනේ" අංගය වෙනුවෙන් කළ වේදිකා සැරසිල්ලද අගනේය. ප්‍රෙඩි සිල්වා මහත්මා ගැයූ " අළුත් කලාවක්" ගීතයටත් සුනිල් ඒදිරිසිංහ මහත්මා ගැයූ "රන් මලක් ලෙස" ගීතයටත් රඟපෑම අංග ඉදිරිපත් විණ. සහන් රන්වල සහ ප්‍රදීප් මුතුකුඩආරච්චි ගැයූ " හෙළේ මනාලී" ගීතයට " ගම අවලඤ්ඤං" ප්‍රසංගයේ ඉදිරිපත් කළ නර්තනය ද පෙළ ගැන්වී තිබුණු අතර මුල් නර්තනය හා සන්සන්දනය කළ නොහැකි වුවද සාපේක්ෂව ඉහළ මට්ටමින් ඉදිරිපත් කිරීමට සැවොම උත්සාහ කළහ. ඇඳුම් නිරමාණයන් එම උත්සාහයන් අගය කළ යුතු වෙයි. "දෙවොල හිස් වෙලා" අංගය සඳහා අගනා කාවඩි නැටුමක්ද ඇතුලත් විය. "වුවිංගම්" හපමන් බුලත්විට සපමින් කතරගම දෙවොල අබියස කාවඩි නාර්තනයේ යෙදුණ ද්‍රවිඩ කාන්තාවකි.

අනතුරුව ආදි ශිෂ්‍යාවන්ගේ නර්තනයක් වේදිකා ගත විය. මෙවර මෙම ප්‍රසංගයේ විශේෂත්වය වූයේ ආදි සිසුවියන්ගේ නර්තනය අබිමවා ගිය වෙනත් නර්තනාංග වර්තමාන සිසු සිසුවියන් විසින් ඉදිරිපත් කිරීමයි.

මෙවර සමරු කළඹ පුවත් පතක ස්වරූපයෙන් කවරය සහිතව නිර්මාණය වීම අළුත් අදහසකි. එමෙන්ම එය බෙදා හැරියේද පුවත්පත් බෙදන්නකුගේ භූමිකාවක් හරහායි. ශබ්ද පරිපාලනය හා ආලෝකකරණය ද මැනැවින් සිදුවූ අතර වේදිකාවේ පසු පස සහ දෙපස වෙනමම විශාල තිර අදිමින් වඩාත් ඉහළ තත්ත්වයේ පසුබිමක් නිර්මාන්‍ය කිරීමට ගන්නා ලද උත්සාහය අගය කළ යුතුයි. ශාන්තා ගමගේ, චන්දි මාපා, සොනාලි නානායක්කාර, දර්ශනී පෙරේරා, රම්‍යා තිලකරත්න, ශ්‍රියානි බමුණුසිංහ, චන්දන රාජපක්ෂ, ප්‍රසන්න ද අල්විස්, කෙනන් කැඩිකෝරාළ, ලලනා කන්දෙගෙදර යන මහත්ම මහත්මීන්ගෙන් යුත් ආචාර්ය මණ්ඩලයේත්, අශෝක වීරරත්න විදුහල්පතිවරයාගේත්, දෙමව්පියන්ගේත් අප්‍රතිහත දෛර්යයේ ප්‍රතිඵලයකි "අපේ විත්ති"

වික්ටෝරියානු භාෂා පාසලේ භාවනා මධ්‍යස්ථානයේ දරු දැරියන්ගේ "ප්‍රඥා පදීප" ප්‍රසංගයද චිරාත් ගත සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන දැල්වීමෙන් ඇරඹින. වසර දහ අටක සේවයෙන් පසු විශ්‍රාම යන ප්‍රාදේශීය කළමනාකාර කොනී බ්‍රැන්බල් මහත්මිය වෙනුවෙන් විශේෂ කථාවක් පැවැත්වීමටත්, තිළින පිදීමටත් මෙවර ප්‍රසංගයේ විශේෂ අවධානයක් යොමු වී තිබිණ. සුපුරුදු පරිදි සාරියෙන් සැරසී ගත් ඕ තොතේ "ආයුබෝවන්" කියමින් සිය කථාව ඇරඹූ අතර "ස්තුතියි" කියමින් එය අවසන් කළාය.

පූජා නැටුමකින් ප්‍රසංගය ඇරඹුනේ "දන්නෝ බුදුන්ගේ" ගීයට අනුවයි. "හැංගී හැංගී" ගීයටත් හින්දි ගීයකටත් නර්තනයක් ඉදිරිපත් කළ දෙවන හා තෙවන වසරේ දරුවන්, කීර්ති පැස්කුවෙල් මහත්මා ගැයූ "ඉස්සර ආදි කාලේ" ගීයට කපිරිඤ්ඤා නැටුමක් ඉදිරිපත් කළ 6-7 ශ්‍රේණිවල දරුවන්, " උඩින් යන්නේ" ළමා ගීයට කළ නිර්මාණයක් ඉදිරිපත් කළ 1-2 වසරේ දරුවන් සිය හැකියාවන් මනාව ඉදිරිපත් කළහ. "කැලෑ රජා" කෙටි නාට්‍යයේ දී ද දරුවන්ගේ රඟපෑම් ඉස්මතු විය. එක් එක් සතුන්ගේ ගමන් විලාශයන් හා ඉරියව් අනුකරණය කරන ලද ආකාරය අපූරුයි. පිරිමි දරුවකු ඉදිරිපත් කළ ඒකල තම්මැට්ටම් වාදනය සුරලකින් ඇරඹී සුරලකින්ම අවසන් වූ අතර ඊට පද පහක් හයක්ම ඇතුලත් විණ. එය ද ඉතා අගය කළ යුතු අංගයකි.

"හෙළ විරුවන්" අංගය නැවුම් අදහසකි. අපේ විරුවන්ගේ පිළිම කතා කරමින් තම තමන් ව හඳුනා දෙන ලදී. දින වකවානු මතකයෙන් හා දෙබස් කඩපාඩමින් ඉදිරිපත් කිරීම මෙහි විශේෂත්වයකි. " හතර බීරි කතාවද" අප අසා ඇති "දොම්පෙට යන පාර" ජන ගීය ඇසුරින් ඉදිරිපත් විණ.

වසර 12 සිසු සිසුවියන් ඉදිරිපත් කල නර්තනය ද සිත් ගන්නා සුළු විය. ඒ ඉදිරිපත් කිරීම "සිත නාබර තාලෙට" ගීයට අනුවයි. ආචාර්ය රෝහණ වීරසිංහ සහ අනුෂා නානායක්කාර ගැයූ "මොනවද මුත්තේ" ගීය කළ රඟ පෑමත් අනතුරුව වේදිකා ගත විය. අනුෂා දැනට අප අතර මෙල්බන් නුවර වසන දක්ෂ ගායිකාවකි."ගොට් ටැල්නට්ස්" අංගයද දරුවන්ගේ රඟපෑම් මතු නොව ගායන, නර්තන හැකියාවන් මුහු කරගත් සිත් ගන්නා සුළු අගංයක් විය. එහි ගීතවලට ප්‍රේක්ෂකාගාරයද,එක්වම එහි සාර්ථකත්වයට සාක්ෂි දරයි."ලෝනා මුණිරාජ" වැනි ගීයක වචන මතකයෙන් නිසියාකාරව උච්ඡාරණය කරමින් ගැයීම අගය කළ යුතුයි. අප නවය වසරේ සිසුහු "මිදුලේ වැලි මාලිගාවේ" ගීතය සඳහා නර්තනය මුහු වූ රංගනයක් ඉදිරිපත් කළහ.

විවිධ කවි, නාට්‍ය හා ගීත ඇතුලත් තවත් අගංයන් ඉන් අනතුරුව ඉදිරිපත් වූ අතර,"සැළලිහිණි සන්දේශය" කැළණිය වැණුම ද ඊට ඇතුලත් විය. ජන කතාවක් ඇසුරින් කළ කෙටි නාට්‍යයේ ද රංගන කුසලතා මැනවින් දැක ගත හැකි විය. මෙහි ගැමි දියණියගේ චරිතය වඩාත් කැපී පෙණින. අවසන් වසවරේ සිසුන් ඉදිරිපත් කළ නැටුම්, ගැයුම්, රැඟුම් ඇතුලත් අංගයකින් ප්‍රසංගය නිම විය.

සම්බන්ධීකරණය කළ අංශය ප්‍රධාන රෝහිණී ජයකොඩි, අනුෂ්කා ඇටිපොල, තුෂාර ප්‍රනාන්දු, සුධාරා කරුණාතිලක, සුජාතා කතකුර, පුණ්‍යා පාදුක්කගේ, රූපිකා සුරවීර යන ගුරු මහත්ම මහත්මීන්ගේත් ආචාර්ය චන්ද්‍රා ආතාවුදගේ මහත්මා ඇතුළු දෙමව්පියන් පිරිසගේත් කැපවීමේ ප්‍රතිඵලයකි මේ.

පොදු වශයෙන් ගත් කළ ප්‍රසංග දෙකෙහිම දුටු විශේෂ ලක්ෂණය වූයේ ගැලපෙන ගීත හා පසුතල දර්ශන තෝරා ගැනීමයි.

"ප්‍රඥා ප්‍රදීප" ප්‍රසංගය ඇරඹීමේදී "දන්නෝ බුදුන්ගේ" ගීතය වෙනුවෙන් කළ අංගයට සරස්වතී දේවියගේ රූපය තිරයේ දර්ශනය වීම ගැටළු සහගත විය. බෞද්ධ සංකල්පයත්, දේව සංකල්පයත් දෙකක් ලෙසටයි අපට හැඟෙන්න් "හෙළ විරුවන්" අංගය සඳහා අංග රචනයේ දී වූ මාරු වීම අත්වැරැද්දක් සේ හැඟෙයි.

මෙම ප්‍රසංගය තුළින් අපගේ ගීත දරුවන්ට හුරු කරවීම ඉතා වැදගත් වන්නේ ඉන් වචන උච්චාරනය,

සිසිර දිසානායක

අදහස් වටහා ගැනීම සාහිත්‍ය රසයක් ලබා දීම, ගායන කුසලතා නැංවීම, ඉදිරිපත් කිරීමේ පුහුණුව ලබා දීම හා සබකෝලය නැතිවීම නිරායාසයෙන් සිදුවන නිසයි. අද ලොව ජනප්‍රියම කලාංගය වන ගීය තුළින් ඒ දේ ලබා ගැනීම පහසු වෙයි. පිරිමි දරුවන්ගේ සහභාගීත්වය ද වර්ධනය වෙනු පෙනෙයි. තරුණ තරුණියන් සාමූහිකව මේ දේ පුහුණු වීමේදීත්, ඉදිරිපත් කිරීමේදීත් ඇතිවන කණ්ඩායම් හැඟීම, සාමූහිකව වැඩ කිරීමේ ගුණය මතු නොව විරුද්ධ පාර්ශ්වය හඳුනා ගැනීමද නිරායාසයෙන් සිදුවෙයි. තරුණයෙකුට, තරුණියක යනු වෙනත් සත්ත්වයෙකු සේ නොහැඟෙයි. තරුණියකට තරුණයෙකු ද වෙනත් අයෙකු සේ නොසිතෙයි. ඒ හඳුනා ගැනීම මුළු ජීවිතය මුළු ජීවිතය පුරාවටම බලපාන කාරණයකි.

වේදිකාවේ කුඩා දරු දැරියන්ගේ දඟකාරකම් ද, ඔවුන්ගේ අත් වැරදීම් ද අප හට නම් ඉතා සුන්දර වෙයි. ඒවාද අප මෙවන් ප්‍රසංගවල බලාපොරොත්තුවන වින්දනයේම කොටස් වෙයි. " ප්‍රඥා ප්‍රදීප" ප්‍රසංගයේද තාක්ෂණික දෝෂ අවම කරගන්නට හැකි වී තිබිණ.

කෙසේ වුවද ප්‍රසංග දෙකේදීම චිත්‍ර කලාව සඳහා හපන්කම් පානා දරුවන්ගේ දක්ෂකම දක්නට නොලැබීම අප හට දැණුන කාරණයකි. නිහඬ වූ පමණින් සිතුවම් හෝ සිත්තරුන් නොසලකා හැරිය යුතු නොවේ. එයද ලොව අන් කිසිම කලාවකට නො දෙවෙනි වන ශ්‍රේෂ්ඨ කලාවකි.

Tutoring

22 years of experience in tutoring in Melbourne with **Proven Results**.....!

Coaching for
- Mathematics for Primary and Secondary
- VCE Mathematics: *Mathematical Methods, General Mathematics, Further Mathematics, Specialist Mathematics*
- VCE Physics
- English from Primary to year 9
- Science for Secondary

- Scholarship and Selective School exams
Melbourne High, Mac.Robertson, Suzanne Cory, Uni High, John Monash, Ivanhoe Grammar, Trinity Grammar, Melbourne Grammar, PEGS, etc.

Small groups - up to 4 students.....!
Individual classes on request

Neranjana Kudaligama
0408 356 821
Masters in Accounting (La Trobe)
B. Applied Science (Computer Science and Software Engineering) (Swinburne)
Civil Eng. (Moratuwa)
Ex. Teacher, VSL - Roxburgh Park Sinhala School

Hemantha Devendra
0409 854 597
VIT Registered Teacher
Post Grad. Dip Edu.(La Trobe)
B. Design (Industrial Design) (RMIT)
Mech Eng (Moratuwa)